**ශීර්ෂය 176 - වරාය හා නාවික කටයුතුඅමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එමමූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය..
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන මහා භාණ්ඩාගාරය වෙත පියවිය යුතුවූ අග්‍රිම ශේෂයරු. 459,566 ක්, මුදල් හා මුදල් සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගිණුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂයේදී මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් චෙක්පතක් ලබා ගෙන භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. |
| (ආ) | අමාත්‍යංශයට අයත් වටිනාකම රු.11,000,000 ක් වූ මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණු අතරඅමාත්‍යංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබුණු වටිනාකම රු.7,858,109 ක් වූ කැබ් රථයක් අමාත්‍යංශයට අයත් මූල්‍ය නොවන වත්කමක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් රු. 3,141,891ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි නිවැරදි අගයන් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කල යුතු වීම. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුවඅමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අත්සනින් යුතුව ඉදිරිපත්කර ඇත. |

## 1.6.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | වාර්ෂික අක් මුදල් අවශ්‍යතා සැලසුම, යාවත්කාලීන කළ දක්ෂිණ අතුරු මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල විස්තර වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අන්තර්ගත කර නොතිබුණි. | චක්‍රලේඛයේ දැක්වෙන අවශ්‍යතා අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | ඉදිරියේදී වාර්ෂික අක් මුදල් සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශීර්ෂ 176-02- සංවර්ධන වැඩසටහන යටතේ විදේශ ආධාර මත ප්‍රධාන වරාය සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා රු.159,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවතුණි. | මුදල් රෙගුලාසි50 හි සඳහන් නියමයන්ට අනුකූලව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම හා සැලසුම්ගත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | ශක්‍යතා අධ්‍යයනයට අදාල බඳු හා රක්ෂණ සම්බන්ධව ආසියානු සංවර්ධන බැංකුවේ කොන්දේසිවලට එකගතාවය පල කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත්, 2019 ජනාධිපතිවරණය හේතුවෙන් වරාය කම්හල් ගොඩනැගිලි හතර ඉදිකිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු තීරණ ප්‍රමාදවීමත්, කන්කසන්තුරේ වරාය ව්‍යාපෘතිය සඳහා යෝජනා ඉල්ලීම් ලේඛණ සංශෝධනයට ලක්වීම හා ඇගයීමේ ක්‍රියාවලිය |

| | | | |
|---|---|---|---|
| | | | අතරතුර ඇතිවූ කරුණු නිරාකරණය කර ගැනීමට සිදුවීමත් ආදිය හේතුවෙන් ප්‍රතිපාදනය උපයෝජනය කල නොහැකිවී ඇත. |
| (ආ) | දක්ෂිණ සංවර්ධනයට අදාල ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,282,020,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් සලසා දී තිබුණි. වර්ෂය අවසානයේදී, මෙම ව්‍යාපෘති තුනට අදාල වියදම් හා භාණ්ඩාගාර පොත් අනුව පැවති බැඳීම් හා බැරකම් රු.226,008,380 ක් ගැලපීමෙන් අනතුරුව තවදුරටත් ඉතිරිව පැවති ප්‍රතිපාදනය රු. 596,587,767ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 47 ක් වී තිබුණි. | 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් දක්ෂිණ සංවර්ධනට අදාල සමාජ ආර්ථික හා යටිතල පහසුකම් නැංවීමේ කටයුතු අමාත්‍යාංශයට පැවරී තිබූ බැවින් හා ඊට අදාල ප්‍රතිපාදනද අමාත්‍යාංශයවෙත ලබාදී තිබූ බැවින්ද අපේක්ෂිත ඉලක්ක වලට ළඟාවීම අමාත්‍යාංශයේ වගකීම වේ. | අමාත්‍යාංශය විසින් සිංහරාජ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන, ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක සඳහා ලබාදී ඇති ඉලක්කගත ව්‍යාපෘති 185 ක් වූ අතර ඒවායින් ව්‍යාපෘති 140 ක් ක්‍රියාත්මක කර තිබුණි. තවද,භාණ්ඩාගාරය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවෙත අක්මුදල් ලබා නොදීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘතිවල අතැති බිල්පත් පියවීමට නොහැකිවීම, සමහර ව්‍යාපෘති සඳහා සක්‍යතා අධ්‍යයනයන් හා ව්‍යාපෘති වාර්තා නොලැබීම ආදිය හේතුවෙන් මුදල් වැයවී නොමැත.<br>අයවැය ඇස්තමේන්තුවේ දක්වා ඇති ඉලක්ක මෙම අමාත්‍යාංශය විසින් ලබාදී නැත. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම්වල එකතු වටිනාකම රු.156,257,557 ක් හා භාණ්ඩාගාර ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 299,706,210 ක් වූයෙන් රු. 143,448,653 ක වෙනසක් නිරූපනය විය. | බැඳීම් හා බැරකම් පිළිබඳව වර්ෂ අවසානයේදී ලබාගන්නා නිවැරදි තොරතුරු මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළයුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින්ද මෙම බැඳීම් හා බැරකම්භාණ්ඩාගාරයට වාර්තා කර තිබීම හේතුවෙන් භාණ්ඩාගාර පොත්වල සිදුවූ ද්විගණනය වීමක් මෙම වෙනස ඇතිවීමට හේතුවී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 03 කට අදාළව වාර්ෂිකප්‍රතිපාදනය ඉක්මවාරු.42,645,949 ක්වූ බැරකම්වලට එලඹ තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා කිසිදු බැරකමකට එළඹීම නොකලයුතු වීම. | ප්‍රතිපාදන ඉක්මවා කිසිදු බැරකමකට එළඹ නැති අතර භාණ්ඩාගාරප්‍රකාශනවලට අනුව බැරකම් ද්වීගණනය කර පෙන්වා ඇති බැවින් වෙනසක් නිරූපනය වේ. |
| (ඇ) | විගණන පරීක්ෂාවන් අනුව හෙළිදරව් කරගත් පරිදි, බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණු, 2019 වර්ෂය සඳහා වූ රු. 4,313,283 ක බැරකම් 2020 ජනවාරි හා පෙබරවාරි මාසයන්හිදී නිරවුල් කර තිබුණි. | අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුලින් වර්ෂයට අදාල වියදම් හඳුනාගැනීමට කටයුතු කල යුතු වීම. | 2019 වර්ෂයට අදාල භාණ්ඩාගාර ගිණුම් තැබීම් ක්‍රියාවලිය අවසන් කල පසු ඉදිරිපත් කල බිල්පත් නිසා බැරකම් ලෙස ගිණුම්ගත කිරීමට නොහැකි විය. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයෙන් බාහිර ආයතන වෙත ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන්අයවිය යුතු රු.172,403 ක් වර්ෂ 15 ක පමණ කාලයක සිට අයකරගෙන නොතිබුණි. තවද වැඩ තහනම්කල හා සේවය හැරගිය සේවකයන් දෙදෙනකුගෙන් අය විය යුතු පිළිවෙලින් රු. 293,470 ක් හාරු. 21,140 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV**වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ජේදය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී**/**2015**/08**පොදු **(i)** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ජේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | පැරණි ශේෂයන්ගේ තොරතුරු සෙයාගත නොහැකි බැවින් මෙම ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත.<br>වැඩ තහනමට ලක්වී ඇති නිලධාරියා ගොනුකර ඇති අභියාචනාධිකරණ නඩුවේ තීන්දුව මත පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතුකල හැකිය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1. සැලසුම් කිරීම

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම අනුව දක්ෂිණ සංවර්ධනය යටතේ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1,250 ක ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාලරාමුව, අපේක්ෂිත නිමවුම හා අපේක්ෂිත ප්‍රතිඵලය ආදිය නිශ්චය කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදයේ (ඉ) ප්‍රකාරව සැලසුම් සකස් කළ යුතු වීම. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නාවික ලේකම් කාර්යාලය විසින්, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත හා එහි සංශෝධන මත අය කරනු ලබන ගාස්තු වර්ග තුනක් හැරුණු විට කාණ්ඩ 10 කට අයත් අනෙකුත් ගාස්තු වර්ග 50 කට අධික සංඛ්‍යාවක් 2006 වර්ෂයෙන් පසුව එනම් වර්ෂ 14 කට අධික කාලයක් තිස්සේ සංශෝධනය නොවී පැවතීමෙන් සැලකිය යුතු ආදායමක් රජයට අහිමිව තිබුණි.<br>2018 ජනවාරි 17 දිනැති අංක 01/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි මේ යටතේ වූ කාණ්ඩ 16 කට අයත් ගාස්තු සංශෝධනය සඳහා වූ පනත් කෙටුම්පතක් 2019 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇතත් 2020 අගෝස්තු 30 දිනවනවිටත් එය නිරීක්ෂණ මට්ටමේ පැවතුණි. | 2018අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාල අංක 01/2018 හා 2018 ජනවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සේවා සම්පාදනයේදී අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සංශෝධන කෙටුම්පත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇතත් අනුමැතිය ලැබී නැත. එම දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත නාවික ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගෙන් අදහස් විමසීමට කටයුතු කල අතර කොරෝනා වසංගත තත්ත්වයක් තුල ගාස්තු වැඩිකිරීම නුසුදුසු බව දැනුම්දී ඇත. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ------------------------------ |
| (අ) | යාපනය අර්ධද්වීපය හා දූපත් අතර වෙරළාසන්න මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා විධිමත් කිරීමේ අරමුණ ඇතිව නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලය හා දියත් මග (Slipway) ඉදිකිරීම යන ව්‍යාපෘති 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. 2018 දෙසැම්බර් 31 වනවිට රු. මිලියන 65.5 ක් වැයකර මුලික ඉදිකිරීම් කාර්යයන් අවසන්කර තිබූ නමුත්, පසුව හඳුනාගන්නා ලද අතිරේක කාර්යයන් අවසන් කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 16 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. කෙසේ වුවද, කාර්යය සාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂ අවසානය වනවිට එම කාර්යයන්ගේ මූල්‍ය ප්‍රගතිය සියයට 9 ක් ද භෞතික ප්‍රගතිය සියයට 10 ක්ද වශයෙන් පහල මට්ටමක පැවතුණි. මේ හේතුවෙන් මුලික සැළසුම් අනුව මෙම ඉදිකිරීම් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2020 ජුලි 31 දින වනවිටත් ඉදිකිරීම් අවසන් කර මහජන උපයෝජනය සඳහා යෙදවීමට නොහැකිව තිබුණි. | ව්‍යාපෘති මනාව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර සාධාරණ කාල සීමාවන් තුළදී කටයුතු නිමකර මහජන උපයෝජනය සඳහා යෙදවීමට කටයුතු කල යුතු වීම. | දියත්මග (Slipway) ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් වන විට අවසන් කර ඇති අතර හඳුනාගත් අතිරේක කාර්යයන් 2020 ඔක්තෝබර් මස අවසන් කිරීමට නියමිතය. කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම 2019 අප්‍රේල් මස වන විට අවසන් කර ඇති අතර එහි අතිරේක කාර්යයන් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. 2019 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා ඇතත් අක්මුදල් ලබා නොදීම නිසා 2019දී නිමකල නොහැකිවිය. |
| (ආ) | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO)සම්මුතියට අනුකූලව, සියළුම ශ්‍රී ලාංකික නාවිකයන් සඳහා ජීව ලක්ෂණ සහිත අනන්‍යතා ලියවිල්ලක් නිකුත් කිරීමට 2015 වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා | නිශ්චිත කාලරාමුව තුල අපේක්ෂිත කාර්යසාධන මට්ටම කරා එළඹීම තුලින් ඉලක්කවෙත ලඟාවීමට කටයුතු කල යුතු වීම. | නාවිකයන් සඳහා ජෛවමිතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය 2020 මැයි 05 දින අවසන් වීමට නියමිත අතර මෘදුකාංග නිර්මාණය අවසන්ව ඇතත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාඩ්පත් |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 20 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 53.46 වැයකර තිබුණි. ක්‍රියාකාරී සැලසුම අනුව, ව්‍යාපෘතියට අදාළ කාර්යයන් අතරින් මෘදුකාංග සංවර්ධනය කිරීමේ කාර්යය සියයට 50 කින් හා අනෙකුත් උපකරණ අත්පත්කර ගැනීම් සියයට 80 කින් අවසන් කිරීමට අපේක්ෂිත වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට අත්පත්කර ගෙන තිබුණු ප්‍රගතිය සියයට 20 ක් පමණක් වී තිබුණි.<br>මේ හේතුවෙන් 2020 ජුලි 31 දින වනවටත් ජීව ලක්ෂණ සහිත (biometric features) අනන්‍යතා පත්‍රයක් සැළසුම් කර අවසාන කර නොතිබුණි. | | ආනයනය කල නොහැකි බැවින් නිකුත් කිරීම් ප්‍රමාදවී ඇත. |
| (ඇ) | සිංහරාජ ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල, මාතර, කළුතර හා රත්නපුර යන දිස්ත්‍රික්ක වල මාර්ග 978 ක්, ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති 58 ක්, අධ්‍යාපන ව්‍යාපෘති 52 ක් හා වෙනත් ව්‍යාපෘති 61 ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීරු. මිලියන 710 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 274 ක් පමණක් වැයකර තිබුණි. ඒ ඒ දිස්ත්‍රික්ක වල සිදුකල ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණු කාර්ය සාධන වාර්තාව අනුව ව්‍යාපෘති 159 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 18 ක භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | වාර්ෂික ඇස්තමේන්තුවලට අනුගතව අපේක්ෂිත කාලරාමුව තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වීම. | වාර්ෂික ඇස්තමේන්තුවල දැක්වෙන ඉලක්ක එවකට දක්ෂිණ සංවර්ධන විෂය පවරා තිබූ අමාත්‍යාංශය විසින් ලබාදී ඇති අතර මෙම අමාත්‍යාංශය විසින් ලබා දී නැත.<br>මෙම අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 159ක් අනුමත කල අතර එයින් ව්‍යාපෘති 131ක100% ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.<br>මුදල් අමාත්‍යාංශය විසින් 2019 නොවැම්බර් 20 සිදු කල දැනුම් දීම මත රත්නපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කර නැත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉහත(ඇ) හි සඳහන් වැඩසටහන යටතේමාතර දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 02ක් හා ජල යෝජනා ක්‍රම 02ක් ක්‍රියාත්මක කිරීම සඳහා පිලිවෙලින් රු.7,889,105 ක් හා රු.23,396,673 ක් වෙන් කර දී තිබුණි. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31වන දින විටත් මෙම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණු නමුත් ප්‍රගති වාර්තා අනුව සියයට සියයක ප්‍රගතියක් ඇති බවට වාර්තාගත කර තිබුණි.<br>තවද, ඉහත ජල යෝජනා ක්‍රම 02ක ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.23,396,673 ක් වූ සම්පූර්ණ මුදලම සමාලෝචිත වර්ෂය තුල දී ගෙවා තිබුණි. | ව්‍යාපෘතිවල අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟාකර ගැනීමට හා ඒවා අරමුණුගත පරිදි මහජන උපයෝජනය සඳහා යෙදවීමට කටයුතු කල යුතු වීම. | අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන 2019 වර්ෂයට අදාල ඉලක්ක එවකට දක්ෂිණ සංවර්ධන විෂය පවරා තිබූ අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ඒවා වේ.<br>ක්‍රියාත්මක කල නොහැකිවූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති දෙකක් අවලංගු කර ඇත.<br>රාජ්‍ය ආයතනයක් වන බැවින් එම ආයතනය වෙත සෘජුවම චෙක්පත් නිකුත් කර ඇත. ඉදිරියේදී එම ආයතනය සමග ගිවිසුම්ගත වීමේ හැකියාව සොයා බලන බව හා භෞතික ප්‍රගතිය සියයට 100 ලෙස දැක්වීම අතපසුවීමකින් සිදුවී ඇති බව මාතර දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී සංචාරක සංවර්ධන ව්‍යාපෘති 10 ක් සහ නගර සංවර්ධන ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 200 ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.මිලියන 169.64 ක් වැයකර සංචාරක සංවර්ධනය හෝ නගර සංවර්ධනයට සෘජුව අදාල නොවන ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. එයින්ද ව්‍යාපෘති 12 ක ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. | ව්‍යාපෘතිවල අපේක්ෂිතකාර්යසාධන මට්ටම ළඟාකර ගැනීමට හා ඒවා අරමුණුගත පරිදි මහජන උපයෝජනය සඳහා යෙදවීමට කටයුතු කල යුතු වීම. | මුදල් අමාත්‍යාංශයේ අංක BD/GPS/155/09/01/HA-2019 හා 2019.11.20දිනැති ලිපිය මගින් වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවන ලෙස කරන ලද දැනුම් දීම මත ගාල්ල දිස්ත්‍රික්කයේ අනුමත කල ව්‍යාපෘති වලින් 5ක් සහ මාතර දිස්ත්‍රික්කයේ අනුමත කල ව්‍යාපෘති වලින් 12ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් විය. |
| (ඊ) | දක්ෂිණ සංවර්ධන මණ්ඩලය විසින් මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 3කට අදාල උප ක්‍රියාකාරකම් 10 ක් හා පිහිණුම් තටාක 3ක් ඉදිකිරීම යන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 270 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15.6 පමණක් වැයකර තිබුණි. | අදාල කාලසීමාවන් තුල අපේක්ෂිතකාර්යසාධන මට්ටම ළඟාකර ගැනීමට හා ඒවා අරමුණුගත පරිදි මහජන උපයෝජනය සඳහා යෙදවීමට කටයුතු කල යුතු වීම. | 2019 වර්ෂය අවසාන භාගයේ මෙම ව්‍යාපෘති යෝජනා ලබා දුන් අතර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කර ඇත. 2019 වසර තුල අදාල මූලික කටයුතු සිදුකර 2020 වසරට අඛණ්ඩ කර ඇත.<br>. |

## 3.4 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය විසින් සිදුකල දෙද්දුව සංචාරක ව්‍යාපෘතිය ට අදාල ශාඛ හා වෘක්ෂලතා පිලිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සඳහා උපදේශකවරුන් තෝරාගැනීම සඳහාවූ ප්‍රසම්පාදනයේදී අභිලාශ කැඳවීම සමාලෝචනය කිරීම, විධිමත් නිර්නායකයක් මත යෝජනා ඇගයීම ආදිය ඇතුළත් උපදේශකවරුන් තෝරාගැනීම හා සේවයේ යෙදවීම සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (2007 අගෝස්තු) අනුගමනය කිරීම වෙනුවට 2006 භාණ්ඩ හා වැඩ සඳහාවන ප්‍රසම්පාදන මාර්ගෝපදේශමත වෙළෙඳපොල මිලසැඳහුම් ක්‍රමය යටතේ මිලගණන් කැඳවා තිබුණි.<br>තවද, මේ සඳහා වූ තාක්ෂණික ඇගයීම කමිටුව පත්කිරීමද එම මාර්ගෝපදේශවල 1.2 හි සඳහන් මූලික ප්‍රසම්පාදන අරමුණුවලට හා 1.4 හි සඳහන් ආචාර ධර්මවලට පටහැනිව සිදුකර තිබුණි. | උපදේශකවරුන් තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව විනිවිධභාවයකින් යුතුව කටයුතු කලයුතු වීම. | ව්‍යාපෘතියට අදාළ අනිකුත් මූලික අධ්‍යයන කටයුතු සිදුකිරීමේදී අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටුවේ (CCEM)අනුමැතියට අනුව එක් පාර්ශවයකින් පමණක් මිල ගණන් කැඳවා (Single Source Method) උපෙද්ශකයන් තෝරාගැනීමට අනුමැතිය ලබාදී ඇත.<br>මෙයද ව්‍යාපෘතියට අදාළ මූලික අධ්‍යනයේ එක් අධ්‍යයනයක් වනබැවින් විගණනයෙන් පෙන්වා දීඇති පරිදි දීර්ඝ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනයකර නොතිබුණි . නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යංශයේ අංක Minlo/03/PP/GEN/13/17 හා 2017.09.29 දිනැති ලිපියෙන් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිබව දන්වා ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිටඉංජිනේරුමය අංශ වලට අයත් නාවික වෘත්තිකයන්ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 ක් ද,තෘතියික මට්ටමේ තනතුරු 22 ක් සහ ද්විතියික මට්ටමේ තනතුරු 35 ක්දපුරප්පාඩුවපැවතුණි. | අමාත්‍යාංශයේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුවීම. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම බඳවා ගැනීම සඳහා අදාල අනුමැතියන් ඉල්ලා ඇත. ඒකාබද්ධ සේවයේ තනතුරු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත කීප අවස්ථාවක දන්වා ඇත. |